# වාර්ෂික වාර්තාව

# 2012

# පෙරවදන

2012 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව අංශ 13 ක් ක්‍රියාත්මක වන අතර, ප්‍රාදේශීය වශයෙන් කලාප කම්කරු කාර්යාල 11 ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 39 ක්, උප කම්කරු කාර්යාල 18 ක් හා දිස්ත්‍රික් කාර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් ක්‍රියාත්මක වේ. ව්‍යවස්ථාදායකය විසින් කම්කරු ප්‍රජාවගේ ආරක්ෂාව හා සුභසාධනය වෙනුවෙන් මේ වන විට අණපනත් 50 ක් සම්මත කර ඇත. මෙම අණපනත් ක්‍රියාවට නැංවීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා අධීක්ෂණ කටයුතු පුළුල් කල අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස දිවයින පුරා වාර්ෂිකව වාර්තා වන කාර්මික ආරවුල් සංඛ්‍යාව සැළකිය යුතු මට්ටමින් පහත හෙළීමට හැකි වී ඇත.

රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා සිදු කල වැටුප් ඉහළ නැංවීමට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා ද අවම වැටුප් මට්ටම් ඉහල නැංවීමේ කටයුතු 2012 වර්ෂය තුල දී ආරම්භ කරන ලදී. ඒ අනුව දැනට ක්‍රියාත්මක වන පඩිපාලක සභා 44න් 18ක අවම වැටුප් මට්ටම් 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහල නැංවීමට කටයුතු කරන ලදී. ඉතිරි පඩිපාලක සභාවල ද අවම වැටුප් ඉහල නැංවීමේ කටයුතු 2013 වර්ෂයේ මුල් කාර්තුව තුල නිම කිරීමට අපේක්ෂිතය.

රාජ්‍ය අංශයේ සේවාවන් ජනතාවට වඩාත් සමීපව හා කාර්යක්ෂමව ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන ඊ - රාජ්‍ය ව්‍යාපෘති වැඩසටහන් හා අනුගත වෙමින් පසුගිය වසර කිහිපය තුල දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් කටයුතු නවීන තොරතුරු තාක්ෂණ ශිල්පීය ක්‍රම භාවිතා කරමින් වඩාත් කාර්යක්ෂම කිරීමට ලැබීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි. ඉදිරි වසර තුල දෙපාර්තමේන්තුවේ කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා නව පරිගණක මෘදුකාංගයක් සකස් කර අවශ්‍ය යටිතල පහසුකම් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මේ තුලින් කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය තව දුරටත් ශක්තිමත් කර දෙපාර්තමේන්තුවේ දැක්ම වන ජාත්‍යන්තර ආර්ථිකය තුල ප්‍රමුඛ මට්ටමින් තරඟ කල හැකි ශ්‍රී ලංකා ආර්ථිකයක් ඇති කිරීම සඳහා රට තුල කාර්මික සාමය ස්ථාපනය කිරීම අවසාන බලාපොරොත්තුව වේ.

මෙම සියළු ප්‍රගතිශීලී ක්‍රියාකාරකම් වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ 2,220 ක් පමණ වන සියළු නිලධාරීන්ගේ දායකත්වය අගය කරනු ලබන අතර, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත ආයතනය විසින් ලබා දෙනු ලබන නිරන්තර සහයෝගය කෘතඥතා පූර්වකව සිහි කරමි.

කම්කරු දෙපාර්තමේන්තුව
කම්කරු මහ ලේකම් කාර්යාලය
කොළඹ 05

වී.බී.පී.කේ. වීරසිංහ
කම්කරු කොමසාරිස් ජනරාල්

# පටුන



| | |
|---|---|
| කාර්මික සාමය | 01 |
| වැටුප් හා සේවා කොන්දේසි | 02 |
| සමාජ ආරක්ෂණය | 03 |
| වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය | 04 |
| විශේෂිත ක්ෂේත්‍රයන් | 05 |
| පොදු පරිපාලනය | 06 |
| සංඛ්‍යාලේඛණ සංග්‍රහය | 07 |
| ඇමුණුම | 12 |


# කාර්මික සාමය

ජාත්‍යන්තර තරගකාරිත්වය හමුවේ දේශීය නිෂ්පාදන රැකගනිමින් ජාතික ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස වැඩපොළ සහයෝගිතාවය හා කාර්මික සාමය අත්‍යාවශ්‍ය සාධකයන්ය, විධිමත් කාර්මික පරීක්ෂණ ක්‍රියාවලියක් තුළින් කාර්මික ආරවුල් අවම කිරීමත්, නියමිත වැටුප් හා සේවා කොන්දේසි ක්‍රියාත්මක කිරීමත්, විශ්‍රාමික දිවිය සඳහා සමාජ සංරක්ෂණය ඇති කිරීමත් මගින් කාර්මික සාමය ස්ථාපිත කල හැකිය.

## කම්කරු පරීක්ෂණ

පහත ප්‍රස්ථාර සටහන් මගින් පසුගිය වසර 04 ක කාලය තුළ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දිවයින පුරා සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව හා වාර්තා වූ කාර්මික ආරවුල් සංඛ්‍යාව දක්වා ඇත.




2006 වර්ෂයට පෙර සාමාන්‍යයෙන් වසරකට දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව 30,000 කට අඩු සංඛ්‍යාවකි. නමුත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මේ වන විට වසරකට කම්කරු පරීක්ෂණ 80,000 ක් පමණ සිදු කරනු ලබයි. මෙලෙස සිදු කරනු ලබන කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව ඉහළ නැංවීමට සාපේක්ෂව දිවයින පුරා ආයතන තුළින් වාර්තා වන කාර්මික ආරවුල් සංඛ්‍යාවෙහි කැපී පෙනෙන අඩු වීමක් දක්නට ලැබේ.

## කම්කරු පරීක්ෂණ වල ගුණාත්මක වර්ධනය

ඉහත ප්‍රස්ථාර සටහන මගින් කම්කරු පරීක්ෂණ වල ප්‍රමාණාත්මක වර්ධනය හඳුනාගත හැකි වුවත් පරීක්ෂණ වල ගුණාත්මකභාවය ද ආරක්ෂා කර ගැනීම ඉතාමත් වැදගත් වේ. මෙම අරමුණින් දෙපාර්තමේන්තුව විසින් කලාපීය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබේ. 2012 වර්ෂය තුළදී මෙවැනි ප්‍රගති සමාලෝචන 05ක් පැවැත්වීමට කටයුතු කල අතර, මෙම රැස්වීම් තුළදී කම්කරු නිලධාරීන්ගේ පරීක්ෂණ වල දුර්වලතා හා අඩුපාඩු හඳුනාගෙන, ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. එමෙන්ම විශේෂිත දුර්වලතා පිළිබඳව ගැඹුරින් සොයා බැලීම, කම්කරු විගණන ඒකකය මගින් සිදු කරනු ලබයි.

## ආර්ථික වර්ධනය හා කාර්මික සාමය

කම්කරු අණ පනත් වල නියමයන් කඩවීමට ලක් වූ අවස්ථා වලදී අවශ්‍ය නෛතික පියවර ගැනීමද දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර, විවිධ කම්කරු අණ පණත් යටතේ ගොනු කරන ලද නඩු සංඛ්‍යාවන් පිළිබඳ විස්තර සංඛ්‍යාලේඛන සංග්‍රහය තුළ ඉදිරිපත් කර ඇත. එමෙන්ම ජාතික වශයෙන් වැදගත් වන හා ඉතාමත් කඩිනමින් මැදිහත් විය යුතු කාර්මික ආරවුල් හා නොසන්සුන්තාවයන් හීදී විශේෂ විමර්ශනයන් පවත්වා අවශ්‍ය පියවර ගැනීමද දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

# වැටුප් හා සේවා කොන්දේසි

පෞද්ගලික අංශයේ සේවා නියුක්ත වුවන්ගේ රැකියා සුරක්ෂිතතාවය හා සුබසාධනය කෙරෙහි බලපාන්නා වූ සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සැකසීම හා ඒවාට නෛතික තත්ත්වයන් ලබා දීමට කටයුතු කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා පහත පනත් යටතේ කටයුතු කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

1. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත.
2. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත.
3. 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත.

**පඩිපාලක සභා**

මේ වන විට ශ්‍රී ලංකාව තුළ පඩිපාලක සභා 44ක් ක්‍රියාත්මක වේ. එම පඩිපාලක සභා සම්බන්ධව 2012 වර්ෂය තුළ පහත කටයුතු සිදු කර ඇත.

- නිල කාල සීමාව අවසන් වූ පඩිපාලක සභා 06ක් සඳහා පත් කිරීම් සිදු කරන ලද අතර, තවත් පඩි පාලක සභා 11 ක මිය ගිය, සේවයෙන් ඉවත් වූ හා විදේශගත සාමාජිකයන් වෙනුවට නව සාමාජිකයින් පත් කරන ලදී.
- හෝටල් හා භෝජනාගාර සේවය පිළිබඳ පඩිපාලක සභාවේ සේවා කොන්දේසි ප්‍රසිද්ධියට පත් කරන ලදී.
- මල්, විසිතුරු පැල හා පළතුරු වගා කිරීම හා අපනයනය කිරීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවක් පිහිටු වීමට කටයුතු කරන ලදී.
- රබර් වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ ආවරණය පුළුල් කිරීම සඳහා විරෝධතා කැඳවන ලදී.
- දැයට කිරුළ වැඩසටහන ආශ්‍රිතව වැටුප් හා සේවා කොන්දේසි පිළිබඳව ආයතන සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් පවත්වන ලදී.

**පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් මට්ටම් ඉහල නැංවීම**

මෙම වර්ෂය තුළ පඩිපාලක සභා තුලින් ආවරණය වන පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් මට්ටම් ඉහල නැංවීමට කටයුතු කරන ලදී. මේ යටතේ පඩිපාලක සභා 38කට අදාල නියෝජිතයින් කැඳවා සාකච්ඡා පැවැත්වීමට කටයුතු කර ඇත. ඉන් පඩිපාලක සභා 18ක අවම වැටුප් 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධියට පත් කරන ලදී. අනෙකුත් සියළු පඩිපාලක සභා සඳහා ද අවම වැටුප් මට්ටම් ඉහළ නැංවීම සම්බන්ධ කටයුතු ඉදිරි වසරේ පළමු කාර්තුව තුළ නිම කිරීමට සැලසුම් කර ඇත.


# සමාජ ආරක්ෂණය

1958 ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් අහිමි පෞද්ගලික හා සංස්ථා අංශයේ සේවකයින්ගේ විශ්‍රාම දිවිය සාර්ථක කර ගැනීමට මහඟු අත්වැලක් වීමේ අභිලාෂයෙන් වැදගත් සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලෙස සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කරන ලදී. මෙම අරමුදලේ පරිපාලනය කම්කරු කොමසාරිස් විසින් ද මූල්‍ය පාලනය ශ්‍රී ලංකා මහා බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් ද සිදු කරනු ලබයි.

## දායක මුදල් රැස් කිරීම

පනතින් ආවරණය කරනු ලබන සියලුම සේවකයින් වෙනුවෙන් යම් මාසයක දායක මුදල් අදාල සේවා යෝජකයින් විසින් ඊළඟ මාසයේ අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කල යුතුය. පසුගිය වසර 05 ක කාල සීමාව තුළ දායක මුදල් රැස් කිරීමේ ප්‍රගතිය පහත ප්‍රස්තාර සටහනින් දැක්වේ.

| වර්ෂය | දායක මුදල (රු. මිලියන) |
|---|---|
| 2008 | 45,951 |
| 2009 | 48,712 |
| 2010 | 54,796 |
| 2011 | 61,879 |
| 2012 | 70,157 |




## සේවක අර්ථසාධක අරමුදල් හිඟ දායක මුදල් අය කිරීම ස්වයංක්‍රියකරණය

සේව්‍යයන් විසින් ගෙවීම් පැහැර හරින ලද හිඟ දායක මුදල් අයකිරීම සඳහා ස්වයංක්‍රිය වාර්තා ජනිත කිරීමේ ක්‍රමයක් ඇති කිරීම සඳහා වන මෘදුකාංග දියුණු කර, අවශ්‍ය යටිතල පහසුකම් සකස් කර ඇත. 2013 වසරේ සිට මෙම කටයුතු පරීක්ෂණාත්මකව ආරම්භ කිරීමට කටයුතු සුදානම් කර ඇත.

## දායක මුදල් ගෙවීම ස්වයංකරණය කිරීම

සේව්‍යයන් හට බැංකු ගිණුම් හරහා ස්වයංක්‍රීයව සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවීමේ හැකියාව ලැබෙන පරිදි සංශෝධනයන් සිදු කර, අවශ්‍ය රෙගුලාසි සකස් කිරීමද අවසන් කර ඇත. ලබන වසරේ සිට මෙම කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

## සේව්‍යයන් (ආයතන) ලියාපදිංචි කිරීමේ කටයුතු විමධ්‍යගත කිරීම

ප්‍රධාන කාර්යාලයට එවීමකින් තොරව දෙපාර්තමේන්තුවේ සියලුම දිස්ත්‍රික් කාර්යාල මඟින් සේව්‍යයන් ලියාපදිංචි කිරීමේ කටයුතු මෙම වසර තුළ ආරම්භ කල අතර, දැනට එම කටයුතු සාර්ථකව සිදු කරමින් පවතී.

## මුදල් ආයෝජනය හා පොලී

2012 වර්ෂය තුල ආයෝජනය කර ඇති මුළු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 1,105,544 කි. එය රජයේ සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, සමාගම් ණයපත්‍ර හා කොටස් වෙළඳපල සඳහා ද ආයෝජනය කර ඇත. 2012 වර්ෂය තුල 10% (ඇස්තමේන්තුගත) පොලී අනුපාතයන් සාමාජික ගිණුම් සඳහා ගෙවීමට කටයුතු කර ඇත.

## සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම

2012 වර්ෂය තුළදී මෙම අරමුදල විසින් සිය සාමාජිකයින්ගේ ප්‍රතිලාභ අයදුම්පත් 115,654 ක් වෙනුවෙන් රුපියල් මිලියන 48,015 ක් ප්‍රතිලාභ වශයෙන් අදාල සාමාජිකයන්ට හෝ නීත්‍යානුකූල ප්‍රතිලාභියාට ගෙවන ලදී.

## වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය

සේවා ස්ථාන වල සිදු වන අනතුරු හා ආපදා, වෘත්තීයමය රෝගාබාධ හා රැකියා කටයුතු ආශ්‍රිතව ඇතිවන අයහපත් සෞඛ්‍යය තත්ත්වයන් අවම කිරීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. අනතුරු හා උපද්‍රව වලින් තොර මෙන්ම, වෘත්තිය සෞඛ්‍යය මනාව සුරැකෙන සේවා පරිසරයක් සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහල යාමට මෙන්ම, නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය පවත්වා ගැනීමටද හේතු වන බව නොරහසකි. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත අනුව සේවකයන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතතාවය නෛතික අවශ්‍යතාවයක් වේ.

### ලෝක සුරක්‍ෂිතතා දිනය

සෑම වසරකම අප්‍රේල් 28 වන දින ලෝක සුරක්‍ෂිතතා දිනය සමරනු ලබන අතර, මෙවර ඒ වෙනුවෙන් බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපයේදී කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතායතනයේ අනුග්‍රහයෙන් සුරක්‍ෂිතතා පා ගමනක් පැවැත්වීමට කටයුතු කරන ලදී. එමෙන්ම, එදින ආයෝජන ප්‍රවර්ධන කලාපයීය සේවක සේවිකාවන් විසින් සිදු කරන ලද ඉදිරිපත් කිරීම් සහිත වැඩසටහනක් ද පැවැත්විණි.

### ජාතික වෘත්තීය සුරක්‍ෂිතතාවය හා සෞඛ්‍යය පිළිබඳ සතිය

සෑම වසරකම ඔක්තෝම්බර් මස දෙවන සතිය තුල ජාතික වෘත්තීය සුරක්‍ෂිතතාවය හා සෞඛ්‍යය පිළිබඳ සතිය පවත්වනු ලබයි. 2012 වර්ෂයේදී මෙම සතිය තුල විධිමත් හා අවිධිමත් අංශ ආවරණය වන පරිදි පහත වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

- කළුතර දිස්ත්‍රික්කයේ පෙදරේරු වෘත්තියේ නියැලෙන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන
- දිවයින පුරා කර්මාන්ත ආයතන වල වාෂ්ප/ හුමාල බොයිලේරු වල තත්වය පරීක්‍ෂා කරනු ලබන බලය ලත් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන
- වෘත්තීය සුරක්‍ෂිතතාවය හා සෞඛ්‍යය පිළිබඳ නෛතික ප්‍රතිපාදන පිළිබඳ දැනුවත් කරමින් රක්‍ෂණ ආයතන නිලධාරීන් වෙනුවෙන් පැවැත්වූ වැඩසටහන
- කොග්ගල, අනුරාධපුර හා හැටන් ප්‍රදේශයන්හි පවත්වන ලද වෘත්තීය සුරක්‍ෂිතතාවය හා සෞඛ්‍යය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

### වෘත්තීය ස්වස්ථතාවය

වෘත්තීයමය රෝගාබාධ ඇතිවිය හැකි සේවා වටපිටාවන් පරීක්‍ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් පාරිසරික මිනුම් සිදු කරනු ලබයි. මේ සඳහා දෙපාර්තමේන්තුව සතු සූක්‍ෂම මිනුම් උපකරණ භාවිතා කරනු ලැබේ. මෙම පරීක්‍ෂා කිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නොමිලේ සිදු කෙරේ. සේවා ස්ථානය තුල සිදු කරනු ලබන පරීක්‍ෂණ මෙන්ම, නියැදි එකතු කර රසායනාගාරය තුල සිදු කරන පරීක්‍ෂණ මඟින්ද මෙම පාරිසරික මිණුම් සිදු කරනු ලබයි. එමෙන්ම, වෘත්තීය රෝගාබාධ හෝ රෝග ලක්‍ෂණයන් පවතීදැයි මූලික අවදියේදී හඳුනා ගැනීම උදෙසා විවිධ ජීව විද්‍යාත්මක පරීක්‍ෂණ සිදු කරනු ලබයි. වර්ෂය තුල,

- පෙණහළු ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්‍ෂණ 147 ක්,
- ශ්‍රවන පරීක්‍ෂණ 115 ක් හා
- සේවා ස්ථාන තුල සිදු කරනු ලබන පාරිසරික මිනුම් 230 ක් සිදු කර ඇත.

# විශේෂිත ක්ෂේත්‍රයන්

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්‍රියාවලිය තුල විශේෂ දායකත්වයක් කාන්තා සේවා නියුක්තිය විසින් ඉටු කරනු ලබන අතර, වැඩ කරන කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම්, ආරක්ෂාව, සෞඛ්‍ය හා සුභසාධන සම්බන්ද පහසුකම් හා වරප්‍රසාද සැලසීම කම්කරු දෙපාර්තමේන්තුව සතු වගකීමකි.

එමෙන්ම ජාතියේ ජීවනාලිය ළමා පරපුර බැවින්, ඔවුන් කායිකව හා මානසිකව සමෘද්ධිමත් කිරීම පිණිස ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමේ විශ්ව ව්‍යාප්ත වගකීම වෙනුවෙන් ද දෙපාර්තමේන්තුව නැගී සිටී. වැඩ කිරීම සම්බන්ධ ළමයෙකුගේ වයස තීරණය කිරීම හා ළමයෙකු නොයෙදවිය යුතු අන්තරායකාරී සේවාවන් හා වෙනත් ආකාරයේ අවදානම් සේවාවන්ට ළමුන් යෙදවීම වැළැක්වීම සඳහා ඒ සම්බන්ධව ලැබෙන පැමිණිලි විභාග කිරීම හා අදාල සේවා යෝජකයින් නීතිය ඉදිරියට ගෙන ඒමද කම්කරු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

### ජාත්‍යන්තර කාන්තා දිනය

ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් උත්සවය කැස්බෑව, දැල්තර ශ්‍රී සුමනාරාම විහාරයේදී කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ මූලිකත්වයෙන් 2012.03.08 වන දින පවත්වන ලදී. 2012.03.03 දින සිට අඩු ආදායම්ලාභී පවුල් වල කාන්තාවන් 200 දෙනෙකු හට ස්වයං රැකියා පුහුණු වැඩමුළු 03ක් පවත්වන ලද අතර, එම කාන්තාවන් බල ගැන්වීම සඳහා ශ්‍රම වාසනා අරමුදල විසින් ස්වයං රැකියා කට්ටල 200ක් කාන්තා දින සැමරුම් උත්සව අවස්ථාවේදී බෙදා දෙන ලදී.

### කාන්තා දැනුවත් කිරීමේ වැඩසටහන්

වැවිලි අංශයේ සේවයේ නියුක්ත කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 19ක් පැවැත්වීමට කටයුතු කරන ලද අතර, ආයෝජන ප්‍රවර්ධන කලාපයීය සේවිකාවන් වෙනුවෙන් වර්ෂය තුළ උපදේශන වැඩසටහන් 15ක් පැවැත්වීමට කටයුතු කරන ලදී. තවද ආයතනික මට්ටමින් සේවිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 70ක් පැවැත්වීමට කටයුතු කර ඇත.

### ජාත්‍යන්තර ළමා දිනය

බණ්ඩාරගම කිඳෙල්පිටිය ජගද්දලා සුබසාධන ළමා නිවාසයේදී කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ මූලිකත්වයෙන් 2012.10.01 දින ජාත්‍යන්තර ළමා දිනය සැමරීමේ උත්සවය පවත්වන ලදී. එහිදී එම ළමුන් උදෙසා ටවර් හෝල් පදනමේ ශිල්පීන් විසින් ඉදිරිපත් කරන ලද කෙටි නාට්‍යයක් හා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද මැජික් සංදර්ශනයක් ද පවත්වන ලදී. එදිනම එම ළමුන් සඳහා විනෝද ක්‍රීඩා වැඩසටහනක් ද සංවිධානය කරන ලදී.

### අනර්ථකාරී ළමා ශ්‍රම යෙදවුම තුරන් කිරීම

අන්තරායකාරී රැකියාවන් ලෙස හඳුනා ගත් රැකියාවන්හි වයස 14-18 අතර ළමුන් සේවයේ යෙදවීම පිටුදැකීම උදෙසා වන මාර්ග සැලැස්ම (Road map) අනුව දෙපාර්තමේන්තුව විසින් අදාල කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. මේ සම්බන්ධව දෙපාර්තමේනතුවේ නිලධාරීන්ද ඇතුලත්ව සමාජ කොටස්කරුවන් දැනුවත් කිරීම සඳහා පුහුණු අත්පොතක් හා නීති අත්පොතක් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. අවදානම් ලෙස හඳුනාගත් ප්‍රදේශ වල අනර්ථකාරී ළමා ශ්‍රම යෙදවුම පිටුදැකීම පිළිබඳ වැඩසටහන් 15ක් පැවැත්වීමට කටයුතු කරනු ලැබීය. එමෙන්ම, මාධ්‍ය මඟින් මේ පිළිබඳ දැනුවත් කිරීම සඳහා සකස් කල "සුමුදු" නැමැති ටෙලිනාට්‍ය රූපවාහිනිය ඔස්සේ විකාශය කිරීමට ද කටයුතු කරන ලදී.

# පොදු පරිපාලනය

සේව්‍ය සේවක ප්‍රජාව වෙත තෘප්තිමත් සේවාවක් ලබා දීම උදෙසා දෙපාර්තමේන්තුවේ භෞතික, මානව හා මූල්‍යමය සම්පත් සංවිධානය කර, ප්‍රශස්ථ ආකාරයෙන් පවත්වා ගැනීම අවශ්‍ය වේ. ඒ අනුව දෙපාර්තමේන්තුවේ පරිපාලනමය කටයුතු සම්බන්ධ කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

**මානව සම්පත**

කම්කරු දෙපාර්තමේන්තුව තුල විවිධ තනතුරු වල නිලධාරීන් 2,219 ක් 2012 වර්ෂය අවසාන වන විට සේවයේ නියුතුව සිටින ලදී. පසුගිය වසර කිහිපය තුල දෙපාර්තමේන්තුවට නව එකතු වීම් හා දෙපාර්තමේන්තුවෙන් බැහැර වීම් පිළිබඳ විස්තර, සංඛ්‍යා ලේඛන සංග්‍රහය තුල ඉදිරිපත් කර ඇත.

වර්ෂය තුලදී දෙපාර්තමේන්තුමය සේවයට අයත් සහකාර කම්කරු කොමසාරිස්වරුන් 9ක් බඳවා ගැනීමට කටයුතු කර ඇත. ලඝු ලේඛිකා තනතුරු 10 ක් වෙනුවෙන් බඳවා ගැනීම් සිදු කර ඇති අතර, රියදුරන් 7 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇත.

දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ හැකියා වර්ධනය උදෙසා සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර, සංඛ්‍යා ලේඛන සංග්‍රහයෙහි ඉදිරිපත් කර ඇත.

**භෞතික සම්පත් සංවර්ධනය**

මහල් 36කින් යුක්තව ඉදි කිරීමට යෝජිත "මෙහෙවර පියස" ගොඩනැගිල්ලෙහි ජම්බාර ගැසීම (Pilling) මේ වන විට අවසන් කර ඇත. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ මිල ගණන් කැඳවා ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී. ටෙන්ඩර් පිරිනැමීමෙන් පසු 2013 වසර තුළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. වර්ෂය තුල වියදම රුපියල් මිලියන 98.9 කි. මීට අමතරව 2012 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද ප්‍රාදේශීය කාර්යාල පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්යාලය | මුළු වියදම (රු. මිලියන) |
|---|---|
| කුලියාපිටිය | 12.8 |
| කළුතර | 19.5 |
| අනුරාධපුර | 19.1 |
| කන්තලේ | 6.9 |
| යාපනය (1 වන අදියර) | 31.0 |

**පුස්තකාලය හා කම්කරු කෞතුකාගාරය**

මෙම දෙපාර්තමේන්තුව ප්‍රමුඛ කම්කරු ක්ෂේත්‍රය හා සම්බන්ධ අනෙකුත් ආයතනයන්හි අවශ්‍යතාවයන්ට සරිලන පරිදි විෂයානුබද්ධ තොරතුරු රැස්කිරීම හා අවශ්‍ය අවස්ථාවන් හිදී ඒවා ලබා දීම මඟින් ආයතනික සේවකයන්ට හා පොදු මහජනතාවට කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම බෙදාදීම කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය මඟින් සිදු කරනු ලබයි. එමෙන්ම දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගෙන යනු ලබන කම්කරු කෞතුකාගාරය තුළ ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ විකාශනය ආකර්ශනිය ලෙස ඉදිරිපත් කර ඇත. තවද, පැරණි කම්කරු අණපනත් හා කම්කරු ක්ෂේත්‍රයට සම්බන්ධ ලේඛණයන් රැස් කර ඒවා සංරක්ෂණය කිරීම ද කම්කරු කෞතුකාගාරය මඟින් සිදු කෙරේ.

**ප්‍රකාශන හා සමීක්ෂණ**

කම්කරු ක්ෂේත්‍රයට අදාල කාලින හා විශ්වසනිය දත්ත හා තොරතුරු, සැලසුම් සම්පාදකයන්, පර්යේෂකයින් හා අනෙකුත් දත්ත ප්‍රයෝජනයට ගන්නන් සඳහා සැපයිම පිණිස දෙපාර්තමේන්තුව මඟින් පහත සමීක්ෂණයන් සිදු කරනු ලබයි.

- වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණය.
- සමාන්‍ය ඉපැයීම් හා වැඩ කල පැය ගණන පිළිබඳ සමීක්ෂණය.

## සංඛ්‍යාලේඛණ සංග්‍රහය

**කාර්මික සම්බන්ධතා අංශය**

| | | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| කාර්මික ආරවුල් පිළිබඳ සංඛ්‍යාලේඛණ | | | | | |
| වාර්තා වූ සංඛ්‍යාව | | 4,653 | 3,948 | 3,756 | 3,702 |
| විසඳූ සංඛ්‍යාව | | 4,294 | 3,462 | 3,384 | 3,695 |
| ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව | | 17 | 42 | 66 | 43 |
| වෘත්තීය සමිති කටයුතු | | | | | |
| ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති / සම්මේලන | | 117 | 107 | 76 | 114 |
| අවලංගු කරන ලද වෘත්තීය සමිති / සම්මේලන | | 55 | 106 | 38 | 02 |
| කාර්මික අධිකරණ කටයුතු | | | | | |
| අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම | | 59 | 24 | 69 | 43 |
| ප්‍රදාන නිකුත් කිරීම | | 32 | 29 | 35 | 26 |
| වැඩ වර්ජන වාර්තා වීම පිළිබඳ සංඛ්‍යාලේඛණ | | | | | |
| වැඩ වර්ජන වාර්තා වීම | වතු | 02 | 09 | 14 | 14 |
| | ආයතන | 06 | 06 | 07 | 20 |
| සහභාගි වූ සේවක සංඛ්‍යාව | වතු | 300 | 3,185 | 2,713 | 4,338 |
| | ආයතන | 4,720 | 1,923 | 3,742 | 5,626 |
| අහිමි වූ මිනිස් දින ගණන | වතු | 300 | 23,037 | 9,877 | 25,043 |
| | ආයතන | 7,365 | 2,034 | 15,543 | 10,774 |
| සේවය අවසන් කිරීමේ අංශයේ කටයුතු | | | | | |
| පැමිණිලි යොමු වූ සංඛ්‍යාව | | 186 | 110 | 86 | 92 |
| පැමිණිලි විසඳූ සංඛ්‍යාව | | 90 | 175 | 111 | 143 |
| සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවසර දීම. | | 46 | 25 | 29 | 31 |
| සමාජ කතිකාවත පිළිබඳ වැඩසටහන් පැවැත්වීම | | | | | |
| සමාජ කතිකා අංශය මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 90 | 86 | 98 | 153 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 5,390 | 4,041 | 4,800 | 4,751 |
| දිස්ත්‍රික් හා උප කාර්යාල මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 108 | 100 | 124 | 225 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 3,953 | 3,496 | 4,478 | 7,902 |

2012/12/31 දින වන විට ක්‍රියාත්මක වෘත්තීය සමිති ගණන - 2,177

2012/12/31 දින වන විට ක්‍රියාත්මක වෘත්තීය සමිති සම්මේලන ගණන - 28

## නීති ක්‍රියා අංශය

| පනත | ගොනු කල නඩු සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 |
| 01. පාරිතෝෂික ගෙවීම් පනත | 1653 | 2459 | 4092 | 3404 |
| 02. කාර්මික ආරවුල් පනත | 60 | 59 | 72 | 77 |
| 03. සේවය අවසන් කිරීමේ පනත | 32 | 39 | 65 | 59 |
| 04. පඩිපාලක සභා ආඥා පනත | 139 | 166 | 238 | 290 |
| 05. සාප්පු හා කාර්යාල සේවක පනත | 20 | 51 | 80 | 132 |
| 06. ප්‍රසූතිකාධාර පනත | 02 | - | 01 | 02 |
| 07. ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 14 | 15 | 05 | 10 |
| 08. සේවක අර්ථසාධක අරමුදල් පනත | 1743 | 1484 | 3483 | 3210 |
| 09. කම්කරු විනිශ්චය සභා නියෝග | 212 | 134 | 153 | 165 |
| 10. අයවැය සහන දීමනා පනත | - | - | 54 | 134 |
| 11. අනුමත අර්ථසාධක අරමුදල් | 04 | - | - | 07 |

## විශේෂ විමර්ශණ අංශය

| | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| පැමිණිලි පරීක්ෂණ | 264 | 401 | 241 | 264 |
| ගණනය කරන ලද හිඟ සේ.අ.අ. වටිනාකම (රුපියල් දහස්) | 17,708 | 31,498 | 153,483 | 313,770 |
| ගණනය කරන ලද ව්‍යවස්ථාපිත මුදල් වටිනාකම (රු. දහස් ) | 6,360 | 10,798 | 12,295 | 40,831 |

**සේවක අර්ථසාධක අරමුදල් අංශය**

| | 2009.12.31 දිනට | 2010.12.31 දිනට | 2011.12.31 දිනට | 2012.12.31 දිනට |
|---|---|---|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව | 12,837,602 | 13,412,847 | 14,162,590 | 14,195,726 *** |
| මුළු සේවායෝජක සංඛ්‍යාව | 180,991 | 185,647 | 192,044 | 197,146 *** |
| අරමුදලේ වටිනාකම (රුපියල් මිලියන) | 769,652 | 899,650 | 1,020,072 | 1,144,931 |
| සක්‍රිය සාමාජික සංඛ්‍යාව (මිලියන) * | 2.05 | 2.16 | 2.21 | 2.25 |
| සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව ** | 61,396 | 62,295 | 64,562 | 68,771 |

| | | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| නව ලියාපදිංචි කිරීම් | සේවාදායකයින් | 591,211 | 719,988 | 750,941 | 127,138 |
| | සේවායෝජකයින් | 5,624 | 5,234 | 6,403 | 10,060 |
| ප්‍රතිලාභ ගෙවීම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 108,066 | 104,528 | 120,109 | 115,654 |
| | ගෙවූ ප්‍රතිලාභ මුදල (රුපියල් මිලියන) | 31,901 | 34,896 | 47,311 | 48,015 |
| දායක මුදල් රැස් කිරීම (රුපියල් මිලියන) | | 48,712 | 54,796 | 61,879 | 70,157 |
| සේ.අ.අ. නිවාස ණය | අනුමත කළ අයදුම් පත් සංඛ්‍යාව | 10,383 | 13,848 | 19,709 | 11,182 |
| | අනුමත කළ ණය මුදල් වටිනාකම (රුපියල් මිලියන) | 2,680 | 4,512 | 6,253 | 3,951 |

* වර්ෂය තුළ එක් වරක් හෝ දායක මුදල් ගෙවන ලද සාමාජික ගිණුම්

** වර්ෂය තුළ එක් වරක් හෝ සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවන ලද සේව්‍යයන්

*** 2012/09/30 දිනට

කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

| | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව | 18,247 | 20,053 | 20,971 | 22,459 |
| සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 4,636 | 4,482 | 4,749 | 6,700 |
| පරීක්ෂකයින් (ඉංජිනේරුවරුන්) සංඛ්‍යාව | 28 | 28 | 27 | 28 |
| පිඹුරුපත් අනුමැතිය | 75 | 104 | 122 | 106 |
| දේශන හා සම්මන්ත්‍රණ | 155 | 265 | 294 | 229 |

වෘත්තීය ස්වස්ථතා අංශය

| | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| කර්මාන්තශාලා පරීක්ෂණ සංඛ්‍යාව | 853 | 1,042 | 220 | 410 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 66 | 186 | 193 | 137 |

සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය

| | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන් | 12 | 8 | 22 | 4 |
| කළමණාකරණ සහකාර පුහුණු වැඩසටහන් | 4 | 1 | 14 | 8 |
| පරිගණක පුහුණු වැඩසටහන් | 24 | 33 | 16 | 33 |
| වෙනත් පුහුණු වැඩසටහන් | 9 | 2 | 2 | 2 |
| පශ්චාත් උපාධි පාඨමාලා | 48 | 8 | 26 | 20 |
| බාහිර පුහුණු | 13 | 16 | 37 | 57 |
| ප්‍රගති සමාලෝචන රැස්වීම් | 6 | 8 | 7 | 5 |
| කම්කරු විගණන | - | - | 13 | 19 |

**මුදල් අංශය**

| | | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | ප්‍රතිපාදනය (රු.) | 769,571,000.00 | 982,340,000.00 | 967,407,000.00 |
| | වියදම (රු.) | 760,752,134.00 | 970,274,622.00 | 953,894,760.00 |
| ප්‍රාග්ධන වියදම් | ප්‍රතිපාදනය (රු.) | 222,000,000.00 | 371,936,197.00 | 372,365,000.00 |
| | වියදම (රු.) | 218,993,558.00 | 333,633,002.00 | 299,512,890.00 |

**ආයතන අංශය**

| | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ සිටි මුළු සේවක සංඛ්‍යාව | 2,185 | 2,184 | 2,271 |
| • දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද නව බඳවා ගැනීම් | 105 | - | 23 |
| • ඒකාබද්ධ සේවයේ නව පත්වීම් ලෙස දෙපාර්තමේන්තුවට පැමිණීම් | 25 | 159 | 30 |
| • ස්ථාන මාරු වීම් (ශුද්ධ) | 2 | 15 | (7) |
| • වෙනත් හේතූන් මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට එකතු වීම් | - | - | 1 |
| • විශ්‍රාම යාම් | (69) | (67) | (52) |
| • වෙනත් හේතූන් මත දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයෙන් ඉවත් වීම් | (64) | (20) | (47) |
| වර්ෂය අවසානයේ මුළු සේවක සංඛ්‍යාව | 2,184 | 2,271 | 2,219 |

## ඇමුණුම

### දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය

